**මාතර මහා නගර සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**----------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අගෝස්තු 12 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 නොවැම්බර් 11 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අප්‍රේල් 20 දින මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මාතර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂ වලදී නිරවුල් කර තිබූ රු.15,756,111 ක ණයහිමි ශේෂයක් සහ රු.9,125,116 ක් වූ ණයගැති ශේෂයක් තවදුරටත් නිරවුල් කළයුතු ශේෂ ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට යැවිය යුතු එකතුව රු.42,346,546 ක් වූ දායක මුදල් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.15,007,881 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ගෙවිය යුතු රු.1,465,550 ක විදුලිය ගාස්තු හා රු.499,463 ක ජල ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**1.3.2 අවිනිශ්චිත ගිණුම**

---------------------

අවිනිශ්චිත ගිණුමේ රු.157,496 ක් වූ ශේෂය නිශ්චිතව හඳුනා නොගෙන අධිකතා හා ඌනතා ගිණුමට ලියා හැරීමෙන් අවිනිශ්චිත ගිණුම පියවා තිබුණි.

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම්**

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 15 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.39,758,330 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට වසර 03ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ 115 ක එකතුව රු.43,487,457 ක් වූ අතර, වසර 03ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 47 ක එකතුව රු. 90,384,646 ක් විය.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 122,471,201 ක් වූ වත්කම් පංති 03 කට අයත් ශේෂ හා එකතුව රු.20,280,359ක් වූ ණයහිමි ශේෂය සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම්**

-----------------------------------------------

පහත විස්තරදැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 570 සහ 571 (1) (2) යන රෙගුලාසි ප්‍රකාර වසර දෙකක කාලයක් ඉක්මවූ එකතුව රු.8,603,187 ක් වූ තැන්පත් ශේෂ 87 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ආ) භාවිතයෙන් ඉවත් කර තිබුණු පිරිවැය රු.5,250,250 ක් වූ වාහන 06 ක් සම්බන්ධයෙන් 2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

### 1.3.7 බලය නොලත් ගනුදෙනු

-----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ .

(අ) මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 188 (ක) වගන්තියට අනුකූල නොවන අයුරින් 2014 හා 2015 යන වර්ෂවල අයවැය ලේඛන මඟින් ප්‍රතිපාදන සලසා නොතිබුණු නමුත්, විජයග්‍රාහී රණවිරු සැමරුම් උත්සව 02 ක් පැවැත්වීම සඳහා රු.838,251 ක වියදම් දරා තිබුණි.

(ආ) 2013 අප්‍රේල් 22 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ අංක 1807/2 දරන (අති විශේෂ) ගැසට් පත්‍රයේ නිවේදනයේ විධි විධානයන්ට අනුකූල නොවී නිශ්චිත කාර්ය පැවරුමක් නොමැතිව නාගරික මන්ත්‍රීවරුන්ට 2014 හා 2015 යන වර්ෂවලදී රු.126,000 ක ගමන් වියදම් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.65,804,015 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.57,385,639 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,418,376 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ ආදායම් ආධාර, ස්වයං උත්පාදන ආදායම් සහ මුළු පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | මුළු පුනරාවර්තන ආදායම් | ආදායම් ආධාර | ස්වයං උත්පාදිත ආදායම් | මුළු පුනරාවර්තන වියදම් | ස්වයං උත්පාදිත ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 397,383,993 | 201,238,921 | 196,145,072 | 331,579,978 | (135,434,906) |
| 2014 | 315,793,322 | 112,760,224 | 203,033,098 | 258,407,683 | (55,374,585) |
| 2013 | 262,154,101 | 103,914,324 | 158,239,777 | 227,123,264 | (68,883,487) |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ආදායම් ආධාරවල වර්ධනයක් පෙන්නුම් කරන නමුත්, ස්වයං උත්පාදන ආදායමේ රු.6,888,026 ක අඩුවීමක් දක්නට ලැබුණි.

(ආ) සෑම වර්ෂයකම පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් වර්ධනය වී ඇති අතර, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එම වැඩිවීම රු.73,172,295 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණද, එම තත්ත්වය කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

(ඇ) ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ස්වයං උත්පාදන ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් නොහැකි තත්ත්වයක් පෙන්නුම් කරනු ලැබේ.

(ඈ) ඉහත දැක්වෙන තොරතුරු අනුව ආදායම් තත්ත්වය ඉහළ නංවා ගැනීමට සභාවේ අවධානය යොමුවිය යුතුව ඇති බවත්, ඒ සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු බවත්, එසේ නොමැති වුවහොත් සභාවේ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයන් උද්ගත වියහැකි බවත්, එමගින් අඛණ්ඩ පැවැත්මට අහිතකර බලපෑම් එල්ලවිය හැකි බවත් නිරීක්ෂණය විය.

## 2.3 ආදායම් පරිපාලනය
-----------------------

### 2.3.1 වරිපනම් බදු
---------------

මහා නගර සභා ආඥා පනතේ 250 (1) (අ) සහ (ආ) යන වගන්තිවල විධිවිධාන පරිදි කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.58,943,438 ක් වූ හිඟ වරිපනම් බදු ශේෂ පැවතුණි.

### 2.3.2 කුලී ආදායම
----------------

හිඟ බදු කුලී ශේෂ අය කර ගැනීම සඳහා මහා නගර සභා ආඥා පනතේ 254 (ආ) (1) සහ (2) යන වගන්තිවල විධිවිධාන පරිදි කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.59,284,003 ක් වූ හිඟ ශේෂ පැවතුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 අනවසර ඉදි කිරීම්**

---------------------

2014 වර්ෂයේදී හා 2015 වර්ෂයේදී අනවසර ඉදි කිරීම් 82 ක් හඳුනාගෙන තිබූ නමුත්, ඒ සම්බන්ධයෙන් මහා නගර සභා ආඥා පනතේ 42 (අ) (1) වගන්ති පරිදි කටයුතු කර නොතිබුණි.

**3.2 සේවක ණය**

---------------

වසර 03 කට වැඩි කාලයක් තිස්සේ අයනොවී පවතින ණය ශේෂවල එකතුව රු.6,802,967 ක් වූ නමුත්, එම ශේෂ අය කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

විධායක ශ්‍රේණියේ හා තෘතියික ශ්‍රේණියේ පවතින පුරප්පාඩු 46 ක් සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්තව සේවයේ යොදවා තිබූ සේවකයින් 205 දෙනෙකුගේ තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

-----------------------------------

කසල වර්ගීකරණයට යොදාගෙන තිබූ භූමිය ජීව වායු ව්‍යාපෘතියක් සඳහා මධ්‍යම පරිසර අධිකාරයට පවරා දී තිබුණු අතර, අධිකාරිය විසින් ඉදිකිරීම් හා යන්ත්‍ර සූත්‍ර වෙනුවෙන් රු.64,356,400 ක වියදම් දැරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.
මේ නිසා වසරකට එකතු කරන ටොන් 12,600 ක් පමණ අපද්‍රව්‍ය වර්ගීකරණය නොකිරීම මෙන්ම කසල කළමනාකරණයද නිසි පරිදි සිදු කර නොතිබුණි.

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය**

----------------------------

2015 වර්ෂයේදී සභා අරමුදල් යොදවා රු.3,374,375 ක් වූ කර්මාන්ත 15 ක් නිම කිරීමට යෝජනා කර තිබුණු නමුත්, ඉන් කර්මාන්ත 07 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

-----------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයක රු.6,630,100 ක් වූ ඇස්තමේන්තුගත සම්පූර්ණ ප්‍රතිපාදනයම සහ තවත් වියදම් විෂයයන් 06 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවලින් රු.303,209,941 ක ප්‍රතිපාදනද ඉතිරි වී තිබුණි. වෙනත් වියදම් විෂයයන් 03 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා රු.9,371,820 ක වියදම් දරා තිබුණි. ආදායම් විෂයයන් 02 ක ලබා කර නොගත් ඉලක්කගත ආදායම රු.311,850,127 ක් විය.

**4.2 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

--------------------------------

2015 වර්ෂයට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා වල නිර්දේශ ක්‍රියාත්මක කිරීම 2016 ඔක්තෝබර් මස දක්වා ප්‍රමාදවී තිබුණු අතර, විවිධ අංශවල පැවති භාණ්ඩ ඒකක 208 ක අතිරික්තය හා භාණ්ඩ ඒකක 267 ක ඌනතාවය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) නිශ්ක්‍රිය වත්කම්

-------------------

ඝන අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා 2013 අප්‍රේල් 04 දින රු.107,200 ක වියදම් දරා මිලදී ගෙන තිබූ මෝටර් ට්‍රයිසිකල් 04 ක් 2016 පෙබරවාරි මස වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**4.3 බේරුම් නොකළ බැරකම්**

-----------------------------

බාහිර පාර්ශ්වයන් 5 කට ගෙවිය යුතු එකතුව රු.112,522,297 ක් වූ බැරකම් හා 2002 වසර සිට 2014 වසර දක්වා කාලයට අදාළ එකතුව රු.11,496,185 ක් වූ හිඟ විගණන ගාස්තු නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය.
(ආ) අභ්‍යන්තර විගණනය.
(ඇ) අයවැය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) මානව සම්පත් කළමනාකරණය
(උ) වාහන පාලනය
(ඌ) ණයහිමි හා ණයගැති පාලනය.